සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

නොවැම්බර් මාසය- 1 සතිය 18 පාඩම - පොතපතෙන් සරු දහම්

1)ගැළපෙන සේ යා කරන්න

| | |
|---|---|
| 1.යම් සමාජයක පිළිගැනීම් , විශ්වාස , සිරිත්විරිත් | යහපත් දිවියකට මං පාදයි |
| 2.සාහිත්‍ය පොතපත පරිශීලනය | ක්‍රියාව |
| 3.කෙනෙකුගේ උතුම්බව තීරණය කරයි | පෙරියපුරාණම් |
| 4.උපදේශ ග්‍රන්ථයකි | හුණු වටයේ කතාව |
| 5.හෙන්ඩ්‍රි ජයසේන | සාර ධර් ම |
| 6.කුරුල්ලන් සඳහා වෙන් වූ ලියද්ද | කුරුලු පාලුව |

2)සිංහල සාහිත්‍යයේ එන උපදේශ ග්‍රන්ථ නම් කරන්න

3)සත්ත්වයින් අතර ද උතුම් ගති පවතින බව හෙළි වන ග්‍රන්ථ දෙකක් හා අවස්ථා දෙකක් නම් කරන්න

4)කෙටි පිළිතුරු සපයන්න

1.සාර ධර් ම උකහා ගත හැකි සංස්කෘත සාහිත්‍යයේ එන ග්‍රන්ථ කීපයක් සඳහන් කරන්න.

2.සමාජ යේ සාර ධර් ම සුරැකීමට නිර්මාණ බිහි කළ ලේඛකයන් හා ඔවුනගේ කෘති නම් කරන්න

3.ඔබ තුළ දියුණු කර ගත යුතු සාරධර්ම ලේඛනයක් සකසන්න

5)මෙම වාක්‍යයන්හි සත්‍යාසත්‍යභාවය වරහන් තුළ සටහන් කරන්න

1.ප්‍රිය වචන කතා කරන්නිය සුබ නිමිත්තකි. (........)

2.නන්දිවිසාල ජාතකයේ එන වෘෂභයා සැරපරුෂ ලෙස අණ දීමෙන් පසු ගැල් ඇද්දේ ය. (........)

3.කඩු දහයකින් වන රිදුමකට වඩා රළු වූ එක් තෙපලකින් වන රිදීම දරුණු ය. (........)

4.අප වචනයක් කතා කිරීමට පෙර දෙවරක් සිතීම අවශ්‍ය නොවේ. (........)

5.දෙයක් වේ නම් එය සුදුස්සාට ම අයිති විය යුතු බව දැක්වෙන්නේ හුණු වටයේ කතාව නාට්‍යයේ ය.(........)

6)සොබා දහමේ අපූරු නිමැවුමක් වන සොඳුරු වන වදුලක් චිත්‍රයට නගන්න.

7)සිරිත් මල් දම , සුභාෂිතය , ලෝකෝපකාරය , ලෝවැඩ සඟරාව ආදියෙහි සඳහන් වන සාරධර්ම ගැන කියවෙන කවි 3ක් ලියන්න

8) *යහපත් වචන කතා කරමු* මැයෙන් රචනයක් ලියන්න